නිපුණතාවය :- 5. මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරය ට පිටපත් කරයි .

නිපුණතා මට්ටම :- 5.2. බැංකු ගනුදෙනු බැංකු ගිණුමේ , බැංකු පොතේ වාර්තා කරයි .

(බැංකු ගිණුම හැඳින්වීම , බැංකු ගිණුමේ ගනුදෙනු සටහන් කිරීමට අදාල මූලාශ්‍ර ලේඛන, බැංකු ගිණුමේ මුදල් සහ චෙක්පත් තැන්පත් කිරීම , චෙක්පත් අගරු වීම සටහන් කිරීම , බැංකු ගිණුම තුලනය කිරීම වාසිදායකශේෂයක් සහිතව)

<u>ඔබගේ පෙළ පොතේ පිටු අංක 112 සිට 119 දක්වා හොඳින් කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි සහ නිශ්චිත පිළිතුරු සපයන්න .</u>

01. බැංකු ජංගම ගිණුම කුමන ලෙජර ගිණුම් වර්ගයකට අයත් වේ ද ?

02. බැංකු ජංගම ගිණුමේ ගනුදෙනු සටහන් කරනු ලබන්නේ කුමන ද්විත්ව සටහන් මූලධර්මයට අනුව ද?

03. බැංකු ජංගම ගිණුමේ මුදල් තැන්පත් කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න.

04. බැංකු ජංගම ගිණුමේ මුදල් සහ චෙක්පත් තැන්පත් කිරීමේ දී අදාල කර ගන්නා මූලික ලියවිලි වෙන වෙනම නම් කරන්න.

05. ව්‍යාපාරයට ලැබෙන චෙක්පත් බැංකු ජංගම ගිණුමේ තැන්පත් කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න.

06. චෙක්පත් මගින් ගෙවීම් කිරීමේ දී එයට අදාලව පිළියෙල කරනු ලබන මූලාශ්‍ර ලියවිල්ල නම් කරන්න .

07. රවිඳු ගේ ව්‍යාපාරයේ 2021.මාර්තු මාසය සඳහා චෙක්පතකින් ගෙවන ලද සේවක වැටුප රු. 150,000 කි. මෙම ගනුදෙනුව ගිණුම් ගත කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න .

08. චෙක්පත් අගරු වීම යනු කුමක්ද ?

09. චෙක්පත් අගරු වීමට බලපාන හේතු දෙකක් නම් කරන්න .

10. චෙක්පත් අගරු වීම සටහන් කිරීමට අදාල කර ගන්නා මූලික ලියවිල්ල කුමක්ද ? 11. අත්පිට විකුණුම් සඳහා ලැබී බැංකුවේ තැන්පත් කරන ලද රු.10,000 ක් චෙක්පත අගරු වූ බව බැංකුව විසින් දැනුම් දෙන ලදි. මෙම ගනුදෙනුව ගිණුම්ගත කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න .

12. ව්‍යාපාරය විසින් ප්‍රවාහන වියදම් සඳහා නිකුත් කරන ලද රු.25,000 ක් චෙක්පත අගරු වූ බව බැංකුව විසින් දැනුම් දී ඇත. මෙය සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න.

අභ්‍යාස.

** ඔබගේ පෙළ පොතේ පිටු අංක 119 හි සඳහන් ක්‍රියාකාරකම් 01 සඳහා පිළිතුරු සපයන්න